## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ඉන්දීය රජයේ අනුග්‍රහයෙන් හෝමියෝපති වෛද්‍ය උපාධි ශිෂ්‍යත්ව 2025/2026

ඉන්දියානු රජයේ අනුග්‍රාහකත්වය යටතේ ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් 10 දෙනෙකු සඳහා බටහිර බෙංගාල විශ්වවිද්‍යාලය යටතේ පිහිටුවා ඇති කල්කටාවේ පිහිටි ජාතික හෝමියෝපති ආයතනයේ (National Institute of Homoeopathy – NIH) 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා හෝමියෝපති වෛද්‍ය උපාධි පාඨමාලාව හැදෑරීමට ශිෂ්‍යත්ව පිරිනැමීම වෙනුවෙන් සුදුස්සන් තෝරා ගැනීම පිණිස සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

පාඨමාලා කාලය වර්ෂ 5 ½ කි. පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් පසුව හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබාගැනීමෙන් අනතුරුව සුදුසුකම්ලත් හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස කටයුතු කිරීම සඳහා අවස්ථාව සැලසෙනු ඇත.

**සුදුසුකම් :**

අ.පො.ස. (උ/පෙළ) විභාගයට විද්‍යා අංශයෙන් පෙනී සිට භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් තුනම එකවර සමත්වී එම විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂයද සමත්වීම හා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ. දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව සමත්වී තිබිය යුතුය. 2025.08.15 දිනට වයස අවුරුදු 18–25 අතර වන අපේක්ෂකයන්ට මේ සඳහා අයදුම් කළ හැක.

**අයදුම් කරන පිළිවෙල :**

සියලුම අයදුම්කරුවන් නම, ලිපිනය, උපන්දිනය, වයස, ස්ථාවර හා ජංගම දුරකථන අංක 02ක් (අයදුම්කරු සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයන් සඳහන් කිරීම අත්‍යාවශ්‍ය බව සැලකිය යුතුය), අධ්‍යාපන සුදුසුකම් හා අ.පො.ස. (උ/පෙළ හා සා./පෙළ) විභාගයන් සමත්වූ වසර ආදිය, පැහැදිලිව සඳහන් කර තමා විසින් සකසන ලද අයදුම්පතක් (ජීව දත්ත පත්‍රිකාව) සමග සියලුම සහතිකපත්වල සහතික කරන ලද පිටපත්ද සහිතව 2025.08.15 දින හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීම කළ හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපතක් **ministryofindigenousmedicine@gmail.com** ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය. ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන මුල් පිටපතට අමතරව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පමණක් ෆැක්ස් අංක **011-2112736** වෙත යොමු කළ යුතුය.

**අතිරේක ලේකම් (පාලන),**
**දේශීය වෛද්‍ය අංශය,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**3 වන මහල,**
**අංක 26, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.**

**තෝරා ගැනීමේ පිළිවෙල :** සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු කුසලතා ලේඛනය අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**සටහන :** මේ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන අතර, කල්කටාවේ පිහිටි ජාතික හෝමියෝපති ආයතනය හා අදාළ පාඨමාලාව පිළිබඳ වැඩි විස්තර **www.nih.nic.in** වෙබ් අඩවියෙන් ලබා ගත හැක. අයදුම්කරනු ලබන පිරිස අතරින් ඉහළ සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන්ට එක් ගමන් වාරයක් (යාමට) සඳහා පමණක් ගුවන් ටිකට් පතක් (Air Ticket) අමාත්‍යාංශය විසින් ලබා දීමට කටයුතු කරනු ලැබේ. පහත දුරකථන අංකවලට ඇමතීමෙන් හා ඉහත සඳහන් ඊ-මේල් ලිපිනයට ලිපි යොමු කිරීමෙන් වැඩිදුර විස්තර දැනගත හැක :- 011-2112742

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ.**
**ලේකම්,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.**